**විසල් මහනුවර ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර I , පියවර II - 2014**

---

විසල් මහනුවර ජල සම්පාදන ව්‍යාපෘතියේ අදියර I , පියවර II හි 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ වර්තමානයේ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (ජ ජා ස නි) ලෙස හඳුන්වනු ලබන එවකට ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ ජපන් බැංකුව (ජා ස ජ බැ) අතර 2007 මාර්තු 28 දින එළඹි අංක එස්එල්-පී 90 දරන ණය ගිවිසුම හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර 2008 සැප්තැම්බර් 3 දින එළඹි අංක එස්එල්-පී 90 දරන අතිරේක ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, වර්තමානයේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. විසල් මහනුවර සහ තදාසන්න ප්‍රදේශ වල ජල සැපයුම් සේවා වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘති පිරිවැය ඇස්තමේන්තුව අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 4,164 කට සමාන ජපන් යෙන් මිලියන 4,664 ක් විය. පසුව, අතිරේක වැඩ හා මිල උච්චාවචනයන් හේතුවෙන් පිරිවැය ඇස්තමේන්තුව රු. මිලියන 7,146 කට සමාන ජපන්යෙන් මිලියන 5,497 ක් දක්වා සංශෝධනය කර තිබුණි. ඉන් රු.මිලියන 6,024 කට සමාන ජපන්යෙන් මිලියන 4,634 ක් සැපයීමට ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය විසින් එකඟ වී තිබුණු අතර ඉතිරි මුදල වන රු.මිලියන 1,122 කට සමාන ජපන් යෙන් මිලියන 863 ක් සැපයීම සඳහා ශ්‍රී ලංකා රජය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2007 මාර්තු 30 දින ආරම්භ කළ අතර 2012 සැප්තැම්බර් 30 වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. පසුව, ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2015 ජූනි 20 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි.ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය

ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි ද යන බව,

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව **,** සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.මිලියන 11.7 ක් වූ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා වන්දි මුදල් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) මහනුවර - පාතදුම්බර ජල සම්පාදන ව්‍යාපෘතිය නම් වූ වෙනත් ව්‍යාපෘතියක් වෙනුවෙන් ඉඩම් අත්පත් කරගැනීම සඳහා ව්‍යාපෘතිය විසින් ගෙවන ලද රු.මිලියන 10 ක් වූ අත්තිකාරම් මෙම ව්‍යාපෘතිය විසින් ගෙවන ලද අත්තිකාරම් ලෙස සලකා තිබුණි.

### 2.2.2 නොසැසඳූ ශේෂ

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, ව්‍යාපෘතියේ කාර්යයන් පිළිබඳ නිම කරන ලද වැඩ වටිනාකම 2014 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 5,319.94 ක්ව පැවතුණි. කෙසේ වුවද, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව, එය රු.මිලියන 6,410.54 ක් ලෙස දක්වා තිබුණි. රු.මිලියන 1,090.60 ක වෙනස සසඳා නොතිබුණි.

### 2.2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 08 වන වගන්තිය ප්‍රකාරව වටිනාකම රු. මිලියන 5 හෝ ඊට වැඩි කොන්ත්‍රාත් භාරගැනීමට අපේක්ෂා කරනු ලබන කොන්ත්‍රාත්කරුවන් පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි විය යුතුය. තවද, ටෙන්ඩර් පිරිනැමීමෙන් පසු දින 60 ක් ඇතුළත පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ටෙන්ඩර් ගිවිසුම් ලියාපදිංචි කළ යුතුය. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් වල නියුතු කොන්ත්‍රාත්කරුවන් විසින් මෙම අවශ්‍යතාවයට අනුකූල වී නොතිබුණි.

(ආ) ණය ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2 වගන්තිය යටතේ ණය නියෝජිතායතනය විසින් අයකරන ලද රු.මිලියන 28.28 ක් වූ පොලිය අතිරේක ණය ගිවිසුම යටතේ ගෙවිය යුතු පොලී ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2014 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම. | උපයෝජනය කළ අරමුදල් සමාලෝචිත වර්ෂය තුළ | | උපයෝජනය කළ අරමුදල් 2014 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|---|---|
| | ජපන් යෙන් මිලියන | රු. මිලියන | රු. මිලියන | ජපන් යෙන් මිලියන | රු. මිලියන | ජපන් යෙන් මිලියන | රු. මිලියන |
| ජ.ජා.ස.නි | 4,634.00 | 6,024.00 | 588.59 | 442 | 541.14 | 3,972.32 | 5,310.84 |
| ශ්‍රී.ලං.ර | 863.00 | 1,122.00 | 60.00 | 49 | 60.00 | 841.84 | 1,040.94 |
| | 5,497.00 | 7,146.00 | 648.59 | 491 | 601.14 | 4,814.16 | 6,351.78 |

**3.2 භෞතික ප්‍රගතිය**

---------------------

ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා අනුව, සේවා ජලාශ හා පොම්පාගාර ඉදිකිරීම හා සම්ප්‍රේෂණ නළ එළීම/ වැඩිදියුණු කිරීම් ඇතුළත් ව්‍යාපෘතියේ කටයුතු 2014 දෙසැම්බර් 31 දිනට බොහෝ දුරට සම්පූර්ණ කර තිබුණි. කෙසේ වුවද, ජලය පිරිසිදු කිරීම් පිරියත, ජලාශය, ජල ටැංකිය හා කාර්යාල ගොඩනැගිල්ල ආදිය සඳහා අදාළ ඉඩමේ අයිතිය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත 2015 දෙසැම්බර් 31 වන විටත් පවරා ගෙන නොතිබුණි.

**3.3 පරිබාහිර වියදම්**

-----------------

ණය ගිවිසුමේ 2 උපලේඛනය ප්‍රකාරව ලබාගැනීම සඳහා හිමිකම් නොමැති එකතුව රු.මිලියන 47.20 ක්වූ සාමාන්‍ය පරිපාලනය හා වෙනත් ඍජු වක්‍ර වියදම් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද බිල්පත්‍ර නිරවුල් කිරීම සඳහා ලබාගෙන ඇති බව විගණනයේදී අනාවරණය විය.

**3.4 මතභේදයට තුඩු දෙන කරුණු**

------------------------------

ව්‍යාපෘතිය එහි පරිපාලන වැඩ සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් බඳවාගෙන තිබුණද, පරිචයක් ලෙස, ව්‍යාපෘති සේවක පාරිශ්‍රමිකය ගණනය කිරීම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිදුකරන අතර වැටුප් පිරිවැයෙන් සියයට 20 ක් පොදුකාර්ය වියදම් ලෙස ව්‍යාපෘතියෙන් අය කරනු ලබයි. සමාලෝචිත වර්ෂය තුළදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ව්‍යාපෘතිය විසින් එසේ ගෙවන ලද පොදුකාර්ය වියදම රු. මිලියන 8.6 ක් විය.

**3.5 මූල්‍ය පාලනය පිළිබඳ ගැටලු**

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය තුළ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.මිලියන 1.1 ක් වූ දේපල, පිරියත හා උපකරණ භෞතිකව සත්‍යාපනය කර නොතිබුණි. තවද ස්ථාවර වත්කම් ලේඛනයක් ද පවත්වා නොතිබුණි.

(ආ) කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2010 ජූලි 26 දිනැති අංක 05 දරන චක්‍රලේඛයේ නියමය පරිදි ව්‍යාපෘතියේ ගනුදෙනු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශයේ විගණනයට භාජනය කර නොතිබුණි.